# පිරිවෙන ජාතික අධ්‍යාපනයට සම්බන්ධ විය යුතු ද?

**ආනන්ද ඩබ්. පී. ගුරුගේ මහතා**

පිරිවෙන් අධ්‍යාපනය සමීක්ෂණයකට ලක් කරන මෙම ශාස්ත්‍රීය කලාපයෙහි ලිපියක මෙබඳු ප්‍රශ්නයක් නැගීමට සිදු වී ඇත්තේ මන්ද?යි අප තුළ පහළ වූයේ දැඩි විතර්කයකි. මෙය වූකලි දරුවකුට පවුලේ හිමි විය යුත්තේ කෙබඳු තැනක්දැයි දැනීම බඳු ය. එහෙත් අවිවාදයෙන් ම ප්‍රශ්න විරහිත ලෙස සැලකිය යුතු කරුණක් සම්බන්ධයෙන් සැකයක් පහළ වී ඇති නම් එය සවිස්තර ව නිරාකරණය කොට ගැනීම කාලෝචිත ය. මෙහිලා භාපුරා කියා කළ යුතුව ඇත්තේ ''පිරිවෙන'' ''ජාතික අධ්‍යාපනය'' යනුවෙන් අප අදහස් කරන්නේ කුමක්දැයි නිරාකරණය කර ගැනීමය.

ජාතික අධ්‍යාපනය යනු ජාතියකට අයත් පුරවැසියන් ගේ ජීවිත සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම්, හැඟීම් හා හැකියාවන් ජනිත කොට දීමට ක්‍රියාත්මක වන උගැනුම් – උගැන්වීම් පද්ධතියයි. මේ අර්ථකථනයෙහි දී අදහස් තුනක් අවධාරණයෙන් දැක්විණ. ඉන් පළමුවැන්න වූකලි ජාතික අධ්‍යාපනයෙහි ත්‍රිවිධ පරමාර්ථය : එනම්, දැනුම හෙවත් පාණ්ඩිත්‍යය බෙදා දීම භාවාත්මක ආකල්ප හෙවත් හැඟීම් සංවර්ධනය කිරීම, හා බුද්ධිමය වූ මෙන් ම ශාරීරික කුසලතා දියුණු කොට දීම. මනුෂ්‍ය ශිෂ්ටාචාරයෙහි මුල් ම යුගයෙහි සිට ම මේ පරමාර්ථ ඔස්සේ අධ්‍යාපනය සකස් වූ බව පිළිගැනීමට අප මෙහෙයවන්නේ තවමත් ප්‍රාථමික තත්වයෙහි සිටින ආදිවාසී ජනකායන් අතර ද මේ කරුණු තුන ම අධ්‍යාපන පරමාර්ථ ලෙස දක්නට ලැබීමයි.

සෑම සමාජයකට ම ආවේණික වූ දැනුම් සමූහයක් ඇත. යටගියාව, පරිසරය, සිරිත් – විරිත්, ඇදහිලි, කලා නිර්මාණ, ආදියට අදාළ වූ මේ දැනුම් සමුදය පරම්පරාවෙන් පරම්පරාවට අවිනාශිතව පවත්වා ගෙන සාමූහික දායාදයක් ලෙස රැකගැනීම අධ්‍යාපනයෙහි ඉතාමත් ම වැදගත් කාර්යය ලෙස සලකනු ලැබුවේ එම සමාජයෙහි චිරස්ථිතියට මෙන් ම සංස්කෘතික අනන්‍යතාවට එය බෙහෙවින් ම අදාළ වූ බැවිනි. ඉතා ඈත යුගයෙහි සිට ම දැනුම සුරක්ෂිත ලෙස රැක ගෙන බෙදා දීමට ගනු ලැබූ පියවර රැසකි. ප්‍රාථමික සමාජයන්හි ජනකථාව මෙන් ම ජනගීය, ප්‍රස්තාව පිරුළු යනාදිය මේ සඳහා යොදා ගනු ලැබූ මාධ්‍ය ය. සමාජ සංකීර්ණ වත් ම එහි දැනුම් සමුදය රැක බලා ගැනීමේ හා බෙදා හැරීමේ කාර්යය විධිමත් කැරිණ. විධිමත් අධ්‍යාපනය ආරම්භ වූයේ එමගිනි.

සෑම විධිමත් අධ්‍යාපන ක්‍රමයක ම මූලික පරමාර්ථය වූයේ පාණ්ඩිත්‍යයයි. එනම් දැනුම් සමූහයෙන් පරිපූර්ණ වූ බුද්ධිමය සංස්කෘතික දායාදය අවබෝධ කර ගැනීමයි. ඒ ඒ යුගයෙහි මෙන් ම ඒ ඒ සමාජයෙහි අවශ්‍යතා අනුව මේ සඳහා ගොනු කරගනු ලැබූ දැනුම් සමූහය වෙනස් විය. වෛදික සමාජය වේද – වේදාංගාදියට එය සීමා

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

කෙළේ ය. ග්‍රීකයෝ ඊට පුළුල් වූ විෂය මාලාවක් සකස් කර ගත්හ. යුදෙව් - ක්‍රිස්තු සමාජයන්හි ආගමික ප්‍රතිපත්ති සමග ජාතික ඉතිහාසය අළලා පිළියෙළ වුණු ‘‘ශුද්ධ ලියවිලි’’ විධිමත් අධ්‍යාපනයෙන් විස්තෘත කැරුණු සංස්කෘතික දයාදය විය. මෑතක් වන තුරු ම අධ්‍යාපනය සහමුලින් ම වාගේ උපයෝගී කරගනු ලැබුවේ බුද්ධිමය සංස්කෘතික දයාදය පරපුරෙන් පරපුරට අත්පත් කොට දීම සඳහා ය. එසේ ම එය අතලොස්සකට පමණක් සීමා විය.

සමාජයේ ඉතිරි කොටසට අවශ්‍ය දැනුම් සමූහය විධිමත් නොවූ මාධ්‍ය වලින් ලැබිණ. ජන අධ්‍යාපනය ලෙස හැඳින්විය යුතු වූ උගැනුම් මඟ නොමැති සමාජයක් නොමැත. එහි මූලික අංග දෙකකි: ඉබේ දැනුම ලබා දෙන මාර්ග හා අධ්‍යාපන ආයතන යට පිටත උගැනීමට පහසුකම් සළසා දෙන මාර්ග. උපන් ද සිට දරුවකු සිය මවගෙන් හා ක්‍රමයෙන් සිය පවුලෙන් ලබා ගන්නා දැනුම් සමූහය නො දැනුවත්ව ම උත්සාහ විරහිත ව අත්පත් කර ගන්නකි. මේ අධ්‍යාපනය කෙතරම් විස්තීරණ දැයි පැහැදිලි වන්නේ දරුවකු පාසැලට ඇතුළු වන්නට පෙර ලබා ඇති දැනුම් සමුදය විග්‍රහ කරන විට ය. හොඳ - නරක පැවැතුම්, පරිසරය, අන්තර් පුද්ගල සම්බන්ධතා යනාදියට අමතර ව මව්බස (නැතහොත් පරිසරය බහුභාෂික නම් භාෂා කීපයක්) උපයෝගී කර ගැනීමට ලබන දක්ෂතාව සුළුපටු නොවේ. පස් අවුරුදු දරුවකු ගේ වාංමාලාව වචන හාර-පන්දහසක් දක්වා පුළුල් විය හැකි අතර ඒකවචන - බහුවචන, කාලත්‍රය. විභක්ති, අසම්භාව්‍ය - විධි - පූර්ව ක්‍රියාදිය පිළිබඳ ව්‍යවහාරානුසාරයෙන් ලබන ප්‍රායෝගික ව්‍යාකරණ දැනුම ද ස්ථාවර වී ඇති බව පර්‍යෙෂණ මාර්ගයෙන් සොයා ගෙන ඇත. දෙමාපියනට පුබ්බාචරිය ලෙස බෞද්ධ සංස්කෘතියෙන් හිමි වී ඇත්තේ අන්වර්ථ තත්ත්වයක් බව පවුල තුළ පවත්නා මේ ආධ්‍යාපනික පරිශ්‍රමයෙන් ස්ඵුට වේ.

සෑම සමාජයක ම විධිමත් අධ්‍යාපනයෙන් පිටත සංවිධානය වූ අධ්‍යාපන පහසුකම් රැසක් ඇත. දරුවනට පමණක් නොව මුළු සමාජයට ම එකසේ විවෘත වූ මේ පහසුකම් ක්‍රමක්‍රමයෙන් වැඩිදියුණු වී ඇත. අප සමාජයෙහි ඈත සිට ම ප්‍රචලිත වූ අවිධිමත් අධ්‍යාපන ක්‍රම උදහරණ කීපයකින් දැක්විය හැකිය : ධර්මශ්‍රවණය හා ධර්මසාකච්ඡාව, කෙනකු හඬ නගා කියවන පොතකට ඇහුම්කන් දීම, නැළවිලි - ගැයුම් හා දෘශ්‍ය කාව්‍ය, කථාන්තර, ජනකවිය, කවිකතා හා කවිකොළය, මෑත විද්‍යාත්මක සංවර්ධනය නිසා ඇතුළු වූ දූය, පුවත්පත, ගුවන් විදුලි ප්‍රචාරය හා රූපවාහිණිය.

මෙලෙස විස්තර කැරුණු අධ්‍යාපන මාර්ග තුනෙන් ම දැනුම ලබා දීමට මුල් තැන දෙනු ලැබුවත් සෑම දැනුමකින් ම ඉස්මතු කැරුණු හැඟීම් මාලාවක්ද වැඩෙන බව පිළිගත යුතු ය. හිතාමතා නො කැරුණත් හැඟීම් පිළිබඳ අධ්‍යාපන පරමාර්ථය අනායාසයෙන් ඉටු වේ. එහෙත් සමාජයක අවශ්‍යතා අනුව පිළිගැනුණු භාවාත්මක ආකල්ප නව පරපුරක බිහිකිරීමට නම් ඒ පිළිබඳ ව විශේෂ වෙහෙසක් කල්පනාකාරිව ගත යුතුය. ජාත්‍යාලය, ආගම් භක්තිය, කෘතඥතාව, මෛත්‍රී - කරුණා - මුදිතාදිය, සහනය, සමානාත්මතාව, ආරද්ධ හා උට්ඨාන වීර්‍යය, යුක්තිගරුකත්වය යන චරිත ලක්ෂණ සමාජයක බිහිකිරීමට නම් අධ්‍යාපනය ඊට අනුකූල විය යුතුය. අප සමාජයෙහි නොයෙක් අවස්ථාවල විධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් ඉටු නුවුණු පරමාර්ථයකි මෙය. පාසැලින් බැරි වූ විට පන්සලෙන් හෝ පල්ලියෙන් එසේ ම පවුලෙන් හා පරිසරයෙන් මේ අඩුව පිරිමසාලීම අත්‍යවශ්‍ය වූ බැවින් අවිධිමත් අධ්‍යාපන ක්‍රම භාවාත්මක ආකල්ප වඩවාලීම සඳහා බෙහෙවින් යෙදිණ. පුවත්පත, ගුවන්විදුලිය, හා රූප

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

වාහිණිය මේ සඳහා අන්‍ය අධ්‍යාපන මාධ්‍ය සියල්ලටම වඩා ප්‍රබල ය. එබැවින් මේ ජන මාධ්‍ය ද ජාතික අධ්‍යාපනයෙහි මූලික අංගයකි.

දැනුමෙන් හා හැඟීමෙන් පමණක් කෙනකු ගේ අධ්‍යාපනය සම්පූර්ණ නොවන බව තරයේ පිළිගැනෙන බැවිනි, හැකියාවන් ලබා දීම තෙවැනි අධ්‍යාපන පරමාර්ථය වන්නේ, පාණ්ඩිත්‍යයට මුල් තැන දෙන විධිමත් අධ්‍යාපනය හැකියාවන් වශයෙන් දියුණු කෙළේ බුද්ධිමය කුසලතා ය. එනම් — පාඨක – රචක කථික යන ත්‍රිවිධ භාෂාත්මක කෞශල්‍යය, තර්කය හා විවාදශීලිත්වය, මතිමතාන්තර තුලනය යනාදිය ය. ඒ හැර එදිනෙද ජීවිතයට අවශ්‍ය හැකියා විධිමත් අධ්‍යාපනයෙන් නොව පවුලෙන් හා පරිසරයෙන් ලබා ගතයුතු විය. එහෙත් වත්මන් මතය හා ක්‍රියාකාරිත්වය අනුව මානසික මෙන්ම ශාරීරික වූද හැකියාවන් වැඩි දියුණු කිරීමද ජාතික අධ්‍යාපනයෙහි යුතුකමකි. කාර්මික විද්‍යාලය මගින් හා පාඨමාලා වලින් මෙන් ම වෛද්‍ය – නීති – තාක්ෂණ ආදී රැකියා සඳහා පුහුණු කරන ආයතන වලින් ද, හැකියා උපදවන විධිමත් අධ්‍යාපන ක්‍රම ක්‍රියාත්මක වේ. මේ හැර විද්‍යා ස්ථාන වලට බාහිර ව කර්මාන්ත ශාලා හා අනිකුත් සේවා ස්ථානවල විශේෂ පහසුකම් සලසා තාක්ෂණික අවිධිමත් අධ්‍යාපන ක්‍රම ප්‍රචලිත වේ.

මෙසේ දැනීම, හැඟීම, හැකියාව යන ත්‍රිවිධ අධ්‍යාපන පරමාර්ථ සපුරාලීම සමාජ යක ක්‍රියාත්මක වන සියලු උගැනුම් හා උගැන්වීම් ජාතික අධ්‍යාපනයට අන්තර්ගත වේ. මෙහිලා ක්‍රියාත්මක වන යන්නෙන් තරයේ ප්‍රකාශ කැරෙන අදහස නම් ජාතික අධ්‍යාපනයට අයත් සැම අංග ම සිතා මතා ක්‍රියාත්මක කැරෙන දේ නොවන බව ය. ඒ අදහසින් මය, උගැනුම් – උගැන්වීම් යන දෙක ම ජාතික අධ්‍යාපනයට අයත් ක්‍රියාකාරිත්ව දෙක ලෙස දැක්වූණේ. මෙලෙස ඉතාමත් ම පුළුල් අන්දමින් ජාතික අධ්‍යාපනය විවරණය කළ විට ඊට අසු නො වන කිසිදු අධ්‍යාපන පරිශ්‍රමයක් නො මැති බව පැහැදිලි වන්නේ ය. එවිට පිරිවෙන් අධ්‍යාපනය ද ජාතික අධ්‍යාපනයෙහි විශේෂ අංගයක් ලෙස ත්‍රිවිධ අධ්‍යාපන පරමාර්ථ සපුරාලීමට ආධාරකාරී වන බව විශේෂයෙන් සනාථ කිරීම අනවශ්‍ය ය.

එහෙත් අප වෙත ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය මෙය නොවේ. මක්නිසාද කිව හොත් මේ ප්‍රශ්නයෙහි ජාතික අධ්‍යාපනය යන්න යොදා ඇත්තේ අතිශයින් ම සීමා සහිත වූවක් නිරූපණය කිරීමට ය. එනම් අප රටෙහි සාමාජික පරිශ්‍රමයක් ලෙස පැවැත්වෙන විධිමත් අධ්‍යාපනය යි. ඇත්ත වශයෙන් ප්‍රශ්නය නගන්නන් ගේ සිත්හි බලපාන්නේ මීටත් පටු වූවකි. විධිමත් අධ්‍යාපනය ද රජය විසින් පමණක් ගෙන යන ව්‍යාපාරයක් නොවේ. ශිෂ්‍යශිෂ්‍යාවන් ගෙන් මුදල් ලබා ගෙන දෙන මෙන් ම ඉඳුරා ගෙවීමක් නො මැතිවද ලබාගත හැකි පෞද්ගලික විධිමත් අධ්‍යාපනයක් ද අප රටෙහි ප්‍රචලිත ය. මේ ප්‍රශ්නයෙහි සඳහන් කැරෙන ජාතික අධ්‍යාපනයට පෞද්ගලික අධ්‍යාපන පරිශ්‍රමය ද අයත් නොවෙතියි සිතන්නට ඉඩ ඇත. එසේ නම් ජාතික අධ්‍යාපනය මෙහිලා යොදා ඇත්තේ රජයේ අනුග්‍රහයෙන් පැවැත්වෙන ආයතන මගින් දෙනු ලබන විධිමත් අධ්‍යාපනය පමණක් නිමිති කොට ගෙන ය. එබැවින් මේ ප්‍රශ්නය ඉඳුරා ඇසිය යුතුව ඇත්තේ ''පිරිවෙන් අධ්‍යාපනය රජයේ ජාතික අධ්‍යාපන ක්‍රමයට කෙසේ සම්බන්ධ විය යුතුද? යන ලෙසය.

මීට පිළිතුරු දීමට පළමුකොට ම පිරිවෙන් අධ්‍යාපනය කුමක්දැයි පැහැදිලි ව වටහා ගත යුතුය. 'පිරිවෙණ' වූ කලී පරිවෙණ නම් පාලි ශබ්දයෙන් බිඳී ආවකි. ආදිම

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ශේෂ පක්ෂෙහි එය යෙදී ඇත්තේ භික්ෂුවක ගේ හෝ භික්ෂුණියක ගේ හෝ කුටිය යන අරුතිනි. ශ්‍රී ලංකා බුද්ධශාසන ඉතිහාසයෙහි දී මහාපරිවෙණ යන්න විධිමත් අධ්‍යාපන සංස්ථාවක් සඳහා යෙදිණ. මෑත යුග වලදී මහා යන උප පදය නොමැතිව ද පරිවෙණ හෙවත් පිරිවෙන අධ්‍යාපන ආයතනයක නම විය. එහෙත් පිරිවෙන පොදු සමාජයට විවෘත වූ ස්වාධීන ආයතනයක් නොවීය. සැම විට ම එය විහාරස්ථානයක අංගයක් විය. එහි නායක, උපාධ්‍යාය ආචාර්ය සැම දෙන ම වාගේ භික්ෂූහු ය. ශිෂ්‍යයෝ ද වැඩි වශයෙන් ම පැවිදි අය ය. විෂය මාලාවෙහි මුල් තැන ද බුදුසමය හා සම්බන්ධ විෂය වලට ම ලැබිණ. කෙටියෙන් කිවහොත් පිරිවෙන වූකලී බෞද්ධ අධ්‍යාපන ආයතනයකි. අප ඉතිහාසයෙහි සඳහන් වන පිරිවෙන් කීපය පිළිබඳ තතු පිරික්සීමෙන් පසු එළඹිය හැකි නිගමන කීපයක් ඇත :—

(1) පිරිවෙනෙන් පිටත ජාතික අධ්‍යාපන ක්‍රමයක් අප රටෙහි නොපැවැතිණ.
(2) පිරිවෙනෙහි ගිහි සිසුනට ද තැනක් තිබිණ.
(3) පිරිවෙනෙහි විෂය මාලාව බුදුසමයට සීමා නොවිණ, අනිකුත් සමයාන්තර ද උගැන්වුණු හෙයිනි.
(4) එකල ප්‍රචලිත වූ කාව්‍ය, ජ්‍යොතිෂ, ආයුර්වේද දී ශාස්ත්‍ර ප්‍රගුණ කිරීමට ද පිරිවෙනෙන් පහසුකම් සැලැස්විණ.

පැරණි පිරිවෙන් අධ්‍යාපනයෙහි පරමාර්ථ හො අධ්‍යයන ක්‍රම හෝ ගැන සවිස්තර තොරතුරක් පොතපතින් නොලැබෙතත්, පසුගිය ශතවර්ෂය මැද දී පිරිවෙන් අධ්‍යාපනයට පුනරුදයක් දුන් සම්මුන් ආවේණික පරමාර්ථ හා අධ්‍යාපන ක්‍රම අනුගමනය කළ බව සිතා ගත හැකිය.

එබැවින් අද පිරිවෙන් අධ්‍යාපනය ගැන සිතන විට අප ගේ මනසට පෙනී යන්නේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හිමියන් හා රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් ද උන්වහන්සේලා දෙනම ගේ ම ආචාර්යභූත වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමියන් ද පැරණි පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයෙන් රැක ගත යුතු අංග තෝරා ගෙන එකල අත්‍යවශ්‍ය වූ බෞද්ධ හා ජාතික පුනර්ජීවයට භික්ෂු අධ්‍යාපනය නැඹුරු කළ අන්දම ය. උන් වහන්සේලාගේ පරමාර්ථය වූයේ කෞතුක වස්තුවක් ලෙස පිරිවෙන ආරක්ෂා කර ගැනීම නොවන බව පෙනෙන්නේ පිරිවෙන ලෝකයේ ශාස්ත්‍රීය සංවර්ධනයෙන් ඈත් නො කිරීමට මුල සිට ම උත්සාහ කළ බවට සාධක ඇති හෙයිනි. මුල සිට ම විද්‍යොදය – විද්‍යාලංකාර පිරිවෙන් දෙක විවෘත ආයතන විය. ගිහියනට මෙන් ම පිටරැටියනට ද එහි පහසුකම් සැලසිණ. නූතන දැනුම වසාලීම ආවේණික අධ්‍යාපනය රැකීමට අවශ්‍ය පියවරක් ලෙස නො සැලකිණ. එහෙත් පිරිවෙන නවීන විද්‍යාලයකට සහමුලින් ම වෙනස් වූ විද්‍යාස්ථානයක් බව කිසි විටක අමතක නො කැරිණ.

මේ ආදර්ශයෙන් මෙරට ප්‍රචලිත වූ පිරිවෙන් අධ්‍යාපනයට රජයේ ආධාරය හා සහයෝගය අවශ්‍ය බවත් එය සපයාදීම රජයේ යුතුකමක් බවත් නිශ්චය කැරුණේ ස්වාධීන ලාංකික රජයකින් නොව ඉංග්‍රීසි පාලන තන්ත්‍රයට අයත් වූ විදේශීය නිලධා-රීන් විසිනි. විද්‍යොදය පිරිවෙනට රජයේ අනුග්‍රහය ලැබුනේ ඔවුන් ගේ පැහැදීම නිසාය යි කිවයුතුය. එම නිලධරයන් පිරිවෙන් අධ්‍යාපනයට අනුග්‍රහයක් දැක්වීමට සූදානම් වූයේ එය අගය කළ හැකි තත්වයක සිටි බැවිනි. ඒ කෙසේද?

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

1848 දී බ්‍රිතාන්‍ය රජයට විරුද්ධව ඇති වූ කැරැල්ලට හේතු විමසූ රජයට වැටහුණු වැදගත් කරුණක් විය. එනම් රට පාලනය කළ උසස් නිලධරයන් – වෙසෙසින් ම එංගලන්තයෙහි සිට ආ සිවිල් නිලධරයන් – මෙ රට සංස්කෘතික ලක්ෂණ හා ගති පැවැතුම් නො දත් බැවින් මහජනයා හා පැවැති සම්බන්ධය සර්වසම්පූර්ණ විශ්වසණීය තත්වයකින් නො පැවැති බවය. ඊට නියමිත වූ පිළියම වූයේ සිංහල, ලංකා ඉතිහාසය හා සංස්කෘතිය පිළිබඳ දූඩි විභාග ක්‍රමයක් නියම කිරීම ය. මේ සඳහා පිටකැරුණු නිර්දේශ පත්‍රවලින් පෙනී යන්නේ ඔවුන් ගෙන් බලාපොරොත්තු වූ දැනුම සුළුපටු නොවූ බව ය. 1852 දී ජේම්ස් ද අල්විස් මහතා සිදත් **සඟරාව** ඉංග්‍රීසියට නඟා පිටු දේශීයයකට අධික සිංහල සාහිත්‍ය ඉතිහාසයක් එහි පූර්විකාව ලෙස පළ කෙළේ මේ විභාගයට සූදනම් වන ශිෂ්‍යයන් සඳහා ය. ඒ. ඇම්. ගුණසේකර මුදලි තුමා සවිස්තර සිංහල ව්‍යාකරණ කෘතියක් ඉංග්‍රීසියෙන් සකස් කෙළේ ද මේ සඳහා ය. ඉංග්‍රීසි නිලධාරීන් යාත්‍රාමුල්ලේ ධම්මාරාම, හික්කඩුවේ ශ්‍රී සුමංගල, දොඩන්දූවේ පියරතන තිස්ස වැනි හිමියන් ළඟට ගියේ මේ විභාග සඳහා සිංහල – පාලි භාෂා හා ඊට අදළ ඡන්දොලංකාර යනාදී විෂය උගැනීමට ය. සිංහල – පාලි පොතපත ඉංග්‍රීසියට නැඟීමට මෙන් ම ඒවා අළලා ශාස්ත්‍රීය පර්යේෂණ කිරීමට ද මේ නිලධරයන් බොහෝ දෙනකු හැකිකම් ලබා ගත්තේ මේ ආශ්‍රයෙනි. **මහපෙන්වීමෙනි**.. එසේ ම මොවුන් අතුරින් චිල්ඩර්ස්, රිස් ඩේවිඩ්ස් ආදී ප්‍රාචීන භාෂා විද්‍යාඥයන් බොහෝ දෙනකු බිහිවූයේ ද මේ නිසා ය. ඔවුන් ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර මුළු ලොව ම පතළ කිරීමටත් ඒවා අගය කරමින් ප්‍රශංසා කිරීමටත් පෙළඹුණේ ඔවුනට ඒවා උගැන්වූ විද්වත් හිමියන්ගේ දක්ෂතාව නිසා ම ය.

ප්‍රාචීන භාෂාශාස්ත්‍ර අගය කළ, ඒවා ලෝකයෙහි ව්‍යාප්ත කිරීමට පුරෝගාමී වූ බ්‍රිතාන්‍ය විද්වත් නිලධරයන් පිරිවෙන් අධ්‍යාපනය රජයේ අනුග්‍රහයට සුදුසු ලෙස සැලකුවේ ඊට අදළ වූ විෂයමාලාව මෙන් ම අධ්‍යාපන ප්‍රතිපත්ති හා ක්‍රම මානුසික සංස්කෘතික දයාදයෙහි කොටසක් ලෙස සැලකූ බැවිනි. එ සේ ම නූතන යුගයෙහි දී ත් රැකිය යුතු වූ ද ඉදිරියට ආරක්ෂා කොට තබාලීමට සුදුසු වූ ද ලක්ෂණ එහි ඇති බව විශ්වාස කළ හෙයිනි. අද ජාතික අධ්‍යාපනයෙහි කෙබඳු තැනක් පිරිවෙනට හිමිද යන ප්‍රශ්නය නිරාකරණය කරන විට මේ කරුණු දෙක සිහිතබා ගත යුතු ව ඇත.

එද විද්‍යොදය පිරිවෙණ රාජ්‍යානුග්‍රහයට පාත්‍ර වූ කල සිට අද දක්වා පිරිවෙන් අධ්‍යාපනය පරිණාමයකට ලක් වූ බව රහසක් නො වේ. ඒ ඒ යුගවලදී රජය මගින් පනවන ලද නියෝග මාලාව පිරික්සන විට මේ පරිණාමයට හේතු මෙන් ම ඉන් ඇති වූ හොඳ නරක ප්‍රතිඵල ද වටහාගත හැකිය.

මේ කාලය තුළ පිරිවෙන් අධ්‍යාපනයෙහි නවීකරණයක් ඇති විය. එය පළමුවෙන් ම පටන් ගත්තේ භික්ෂු අධ්‍යාපනය නූතන සමාජයෙහි අවශ්‍යතා අනුව සකස් කිරීමේ පරාමාධ්‍යාසයෙනි. ගිහි සමාජයෙහි දැනුම් හැඟුම් - හැකියාවන් වෙනස් වන්දමින් දියුණු වෙමින් පවත්නා රටක භික්ෂූන් වහන්සේ ශත වර්ෂ ගණනාවකින් පසුපස තබා ලන අධ්‍යාපනයක් නුසුදුසු බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇත. එහෙත් අධ්‍යාපන විශේෂඥයනට මෙන් ම මහාසංඝයා වහන්සේට මෙතෙක් විසඳාගත නො හැකි ගැටළුවක් වී ඇත්තේ කාලෝචිත භික්ෂු අධ්‍යාපනයක් කුමන ප්‍රතිපත්ති මත ගොඩ නැඟිය යුතුද කෙබඳු විද්‍යාස්ථාන ක්‍රමයකින් ක්‍රියාත්මක කළ යුතුද යන්න තීරණය කිරීමට නො හැකි වීම යි. මේ සම්බන්ධයෙන් පවත්නා මතිමතාන්තර ඒ තරමට ම

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

විවිධ ය. එහෙත් එක් කරුණක් පිළිබඳ විමතියක් පළකිරීමට බොහෝ දෙනා අ
මැති වෙති: එනම්, භික්ෂු අධ්‍යාපනයට ඉතාමත් උචිත විද්‍යාස්ථානය පිරිවෙන
යන්න ය. ඊට හේතුව භික්ෂූන්ගේ ම ආධිපත්‍යයෙන් හා ආචාර්යත්වයෙන් විහාරා
බද්ධව පවත්නා පිරිවෙන භික්ෂු අධ්‍යාපනයට යෝග්‍ය එක ම පරිසරය බව ප්‍ර
කිරීමට නොහැකි වීම ය. එසේ නම් නූතන යුගයට ගැලපෙන සේ එකතු කළ යුතු
අළුත් දැනුම් හැකියාවන් - හැකියාවන් පිරිවෙන මගින් ම ලබාදිය යුතුය යන්න ද විවා
විරහිත ය.

1947 — 1960 අතර කාලපරිච්ඡේදය තුළ කෙමෙන් සිදු වූ නවීකරණ පිරිවෙන්
අධ්‍යාපන ක්‍රමයෙහි මූලික ආකෘතිය වෙනස් කෙළේ සුළු වශයෙනි. ප්‍රාචීනභාෂෝප
කාර සමිතියෙහි විභාග සඳහා නියමිත නිර්දේශ පත්‍ර අනුව සකස් වූ පාඨමාලා ද
අනුව ම ක්‍රියාත්මක වූ උගැන්වීමේ ක්‍රමය ද නිසා පිරිවෙන ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර වල
මුල් තැන දුන්නේය, ආවේණික අධ්‍යාපන ක්‍රම අනුව අටුවා, ටීකා, ටිප්පණි, සන්න,
ගැටපද අනුසාරයෙන් පැරණි පාලි, සංස්කෘත, ප්‍රාකෘත, හා සිංහල සාහිත්‍යකෘ
උගැන්විය. බාලාවතාරය, සද්දනීතිය, සාරස්වතය, සිදත්සඟරාව, යනාදි ව්‍යාකරණ
කෘති වලින් පිළිබිඹු වන පුරාතන ව්‍යාකරණ ශාස්ත්‍රයට විශේෂ අවධානයක් යොමු
කෙළේ ය. වතපොත් කිරීම, ලක්ෂණ අකුරු ලිවීම, නිවැරදි උච්චාරණය යනාදිය
භාෂාඥානයෙහි අත්‍යවශ්‍ය ලක්ෂණ ලෙස සලකන අතර ස්වාධීන නිර්මාණයන් ගද්‍ය
යෙන් හා පද්‍යයෙන් රචනා කිරීම උසස් ම හැකියාව ලෙස දැක්විය.

බුදු සමය වෙන ම විෂයක් ලෙස උගැන්වීමෙහි අවශ්‍යතාවක් පිරිවෙනට නො
පෙනුනේ ප්‍රාචීන භාෂොපකාර සමිතියෙහි විභාග සඳහා එය විෂයක් නුවූ නිසා ම
නො වේ, නියමිත පාලි හා සිංහල සාහිත්‍යකෘති සවිස්තරව උගත් විට නිතැතින් ම
ලැබෙන දැනුමට අමතර ව බුදුසමය උගැන්වීමේ අවශ්‍යතාව නො පෙනුණු බැවිනි.
සංස්කෘත කෘති ලෙස ද බුද්ධචරිත, සෞන්දරනන්ද කාව්‍ය, බෞද්ධශතක යන පොත්
නියමිත විය. තර්ක ශාස්ත්‍රය පිළිබඳ නිර්දේශ පත්‍රයෙහි තර්ක සංග්‍රහයට මෙන් ම න්‍යාය
බින්දුවට ද එකසේ අවධානය යොමු වුණු බැවින් හින්දු - බෞද්ධ තර්ක ශාස්ත්‍ර එක විට
උගැන්විණි. ලංකා ඉතිහාසය ගැන ද වූයේ මෙ වැනි ම අත්දැකීමකි. මූලග්‍රන්ථවලින්
උගැන්වුණු ඇ වෙන වෙන ම විෂයමාලාවට විෂය ලෙස ඇතුළත් කිරීම අවශ්‍ය නොවිය.

මෙසේ පිරිවෙන් අධ්‍යාපනය භික්ෂූන්ගේ සාමයික හා සාමාජික සේවාවන් මැන
වින් ඉටු කිරීමට අවශ්‍ය දැනුම් - හැඟුම් - හැකියාවන් ජනිත කොට ලූ නමුදු නූතන
විද්‍යාලවල අධ්‍යාපනය ලත් ගිහියනට අවවාදනුශාසනා කිරීමට නම් තවත් දැනුම්
සමූහයක් ලබා තිබිය යුතු වූ බව පැහැදිලි විය. ලෝක ඉතිහාසය හා භූගෝලවිද්‍යාව
බටහිර මෙන් ම පෙරදිග දර්ශන හා සමයාන්තර, නවීන විද්‍යාවෙහි මූලධර්ම, ආර්ථික
හා සමාජ විද්‍යා පිළිබඳ පුළුල් අවබෝධය මේ සම්බන්ධයෙන් පිරිවෙන් අධ්‍යාපනයට
එකතු කළ යුතු බව භික්ෂු අධ්‍යාපනයෙහි විශේෂ සංවර්ධනයක් අපේක්ෂා කළවුන්
ගේ විශ්වාසය විය. මේ සියල්ල අහසුවෙන් ලබාගැනීමේ මාර්ගයක් ලෙස ය, ඉංග්‍රීසි
භාෂාව බොහෝ විට නිර්දේශ කරනු ලැබුවේ.

1956 — 60 අතර කාලය තුළ කැරුණු සමීක්ෂණ හා සාකච්ඡා කරණ කොට ගෙන
පිරිවෙන් අධ්‍යාපනයෙහි මූල ස්වරූපයට හානියක් නොවන සේ නව විෂයමාලා මෙන්
නූතන අධ්‍යාපන ක්‍රම උපයෝගී කොට ගත හැකි වේයයි අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රති
පත්ති පිළියෙළ කරන්නවුනට පෙනී ගියේය. එබැවිනි, මේ කාලපරිච්ඡේදය තුළ

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

පිරිවෙන් අධ්‍යාපනය සහමුලින්ම වාගේ වෙනස් කොට ලීමට සමත්වූ පණතක් සකස් කැරුණේ. මෙහිලා එක් කරුණක් පැහැදිලි කළ යුතුව ඇත. එම පිරිවෙන් පණතේ එක වරට පරස්පර විරෝධී පරමාර්ථ කීපයක් ම ඉටුකර ගැනීමට උත්සාහ කිරීමය. ඒ පරමාර්ථ මෙසේය :—

(1) භික්ෂු අධ්‍යාපනය වර්තමාන අවශ්‍යතාවනට අනුකූල වන සේ නවීකරණයකට ලක් කිරීම,

(2) සිංහල මාධ්‍යයෙන් පාඨශාලාවන්හි අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලයට ඇතුළුවීමේ සුදුසුකම් ලබා සිටි ශිෂ්‍ය සමූහයට සිංහල මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනයක් දීමට මැලි බව තරයේ ප්‍රකාශ කොට සිටි ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙහි තීරණය නිසා රටෙහි ඇතිවුණු ගැටළුව නිරාකරණය කිරීම,

(3) දිගු කලක් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි බෞද්ධයනට හිමි වරප්‍රසාද ගැන නො තකා හැරීම නිසා පැනනැඟී තුබුණු විෂමතාව මහ හරවා ලීමට නව මාර්ග සෙවීම,

(4) මහා සංඝයාට හා විහාරස්ථානවලට රජයේ අනුග්‍රහය වැඩි වැඩියෙන් දක්වීමට පහසු වූද විවාදයට තුඩු නො දෙන්නාවූද ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

එවක සමාජයෙහි තුබුණු ප්‍රශ්න රාශියක් ම මේ පණතෙන් විසඳිය හැකි වූ බව පෙනෙන්නකි. පිරිවෙන් ආධාර මුදල් වැඩි කැරිණ. නව පිරිවෙන් ඇරඹීමට අනුබලය දෙනු ලැබිය. විද්‍යෝදය – විද්‍යාලංකාර පිරිවෙන් දෙක මුල් කොට ගෙන විවෘත වූ නව විශ්වවිද්‍යාලය දෙකෙහි අනුබද්ධ ආයතන ලෙස පිරිවෙන් සංඛ්‍යාවකට උසස්වීමේ ඉඩකඩ සැලැසිණ. එම විශ්ව විද්‍යාලයන්හි පාඨමාලා අනුව උගැන්වීම වෙනස් කර ගැනීමට පිරිවෙන් වලට හැකි විය. විෂය මාලාව පුළුල් වන්නට පුළුල් වන්නට ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ විභාග වලට පමණක් යොමු වී සිටීමේ අවශ්‍යතාව මග හැරිණ. රජයේ අනිකුත් විභාග සඳහා ශිෂ්‍යයන් පුහුණු කිරීමට හැකි විය. පැවිදි ශිෂ්‍යයනට පමණක් සීමා කිරීමට නීතියෙන් නියෝගයක් කොට නො තිබුණු බැවින් පිරිවෙන බාලක – බාලිකාවනට ද විවෘත විය. ආධාර මුදල විෂයමාලාව හෝ විභාග ක්‍රමය හෝ අනුව නොව ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ම නියම විය. මෙය ගිහි ශිෂ්‍ය – ශිෂ්‍යාවන් බඳවා ගැනීමට රුකුලක් විය. ඒලෙස ම ශිෂ්‍ය සංඛ්‍යාව අනුව රජයෙන් ඉඳුරා වැටුප් ලබන ගුරුවරුන් බඳවා ගැනීමට ද අවසර ලැබිණ. පිරිවෙන උපාධිධාරී ගුරුවරුනට පහසුවෙන් රැකියා සපයන ආයතනයක් විය.

මේ විපර්‍යාස මාලාවෙන් රජය අදහස් කළ පරමාර්ථ සතර ම ඉටුවිය. විශේෂයෙන් ම අධ්‍යාපනය අතින් අතරමං වීමට නියමිත ව සිටි තරුණ පරපුරකට නව දොරටුවක් විවෘත විය. උසස් අධ්‍යාපනය සිය නිවසට නුදුරු තැනකින් ලබා ගැනීමේ භාග්‍යය විශාල පිරිසකට අයත් විය. සාමාජික වශයෙන් මීන් බොහෝ දෙනකුට වූයේ විශාල ප්‍රයෝජනයකි. ඔවුනට සෙතක් ම සැලසුණු බව — මේ පිරිවෙන් ප්‍රතිසංස්කරණයෙන් අවස්ථා ලැබීමෙන් රටට ජාතියට සේවය කිරීමට හැකියාව ලැබූ පිරිස ගැන සිතනවිට පිළිගත යුතුව ඇත. එහෙත් ඉන් පිරිවෙනට වූයේ කුමක්ද? පිරිවෙනත් විද්‍යාලයත් අතර වෙනසක් නැති විය. පිරිවෙනේ විශේෂ ලක්ෂණ වූ පාඨමාලා හා උගැන්වීමේ ක්‍රම අතුරුදහන් විය. පැවිදි සිසුන්ගේ අධ්‍යාපන – පරිසරය සහමුලින් ම වෙනස් විය. ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවනට විද්‍යාලයකින් ලැබෙන පහසුකම් පිරිවෙනෙහි නො ලැබිණ. ක්‍රීඩා හා බාහිර වැඩ පිරිවෙන් වල දියුණු නො කැරුණු බැවිනි. පිරිවෙන් ශිෂ්‍ය – ශිෂ්‍යා

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

වන්ගේ ආගම **භක්තිය හා චරිතසංවර්ධනය** විද්‍යාල ශිෂ්‍යයන් ලබා සිටි තත්ත්වයට උසස් යයි නොයෙක් විට ප්‍රකාශ කැරුණු නමුදු ඒ සඳහා විද්‍යානුකූල පර්යේෂණාත්මක සාධක ඉදිරිපත් නො කැරිණ.

පසුගිය අවුරුදු තිහ තුළ පිරිවෙන් අධ්‍යාපනය රැකගැනීමේ අභිප්‍රායෙන් රජය ගත් පියවර බොහෝ ය. 1960 දී ක්‍රියාත්මක වූ වැඩපිළිවෙළ සහමුලින් ම වාගේ වෙනස් වී ඇත. එහෙත් පිරිවෙනෙහි මූලස්වරූපය නැවත ඇති කොට ලීමට කිසි සේත් ම නොහැකි බව පිළිගැනීමට කරුණු යෙදී ඇත. පිරිවෙන් අධ්‍යාපනයෙහි ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව නැවත නැවතත් මහාජන උද්ඝෝෂණ මගින් ඉදිරිපත් කැරෙන්නේ තවමත් සකස්විය තැන් ඇති බැවිනි.

මෙසේ පිරිවෙන විකාශනයට පත්වූ අන්දම් විමසීමෙන් පසුව ය, රජය පිරිවෙනට කෙබඳු තැනක් දිය යුතුද යන ප්‍රශ්නය නැගිය යුත්තේ. පිරිවෙන අප රටට විශේෂ වූ ජාතික වස්තුවක් බව පළමුකොට ම පිළිගත යුතුය. එහෙත් එය අපගේ පැරණි නගර වල නටබුන් මෙන් නොනැසී පවත්වා ගෙන යාමට වුවමනා කටුකොහොල් පිරිසිදු කිරීමෙන් කෞතුකවස්තුවක් ලෙස ආරක්ෂා කොට ගත නො හැකි ය. පිරිවෙන අධ්‍යාපන පරිශ්‍රමයෙහි අංගයක් ලෙස ජීවමාන වූ වැඩෙන නැසෙන වෙනස් වන ආයතනයක් බැවිනි. මෙ වැනි ආයතන උත්සාහයෙන් හෝ බලෙන් හෝ පමණක් පවත්වා ගෙන යා නො හැකිය. ඉන් සමාජයට අදාළ වූ අවශ්‍ය සේවයක් ඉටු නොවේ නම් ඒවා ඉබේ ම අතුරුදහන් වන්නේ ය.

පිරිවෙන් අධ්‍යාපනය රජයේ අනුග්‍රහයෙන් පවත්වා ගෙන යනු ලබන ජාතික අධ්‍යාපන ප්‍රණාලියෙහි වැදගත් අංගයක් ලෙස පවත්වා ගෙන යාමට රජයට බල කළ හැකිය. ඒ සඳහා රජයෙන් මිල මුදලින් මෙන් ම විශේෂ වරප්‍රසාද මාර්ගයෙන් ආධාර ද ලබාගත හැකිය. එහෙත් එ පමණකින් පිරිවෙන් අධ්‍යාපනය රැක ගත නො හැකිය. පිරිවෙන් අධ්‍යාපනයෙහි ආවේණික ලක්ෂණ නො රැකුණොත් පිරිවෙන නමින් කුමක් වුවත් ක්‍රියාකාරිත්වයෙන් හුදු විද්‍යාලයක් වේ. එසේ නොවීමට වග බලා ගත හැක්කේ පිරිවෙන් අධ්‍යාපනයෙහි විශිෂ්ඨ සේවාව අගය කරන මහා සංඝයා වහන්සේට ය. පිරිවෙන් අධ්‍යාපනය හා භික්ෂු අධ්‍යාපනය පිළිබඳ පවත්නා ප්‍රශ්න රාශියක් විසඳා ගැනීමට නො පමාව උත්සුක වීම නිර්දේශ කළ යුතු වන්නේ එබැවිනි.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk